මාතර ප්‍රාදේශීය සභාව - 2021

-----------------------------------

## 1 මූල්‍ය ප්‍රකාශන

----------------

### 1.1 තත්ත්වාගණනය කළ මතය

---------------------------------

මාතර ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය මෙහෙයුම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට මාතර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

--------------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

------------------------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම් අගයන ලදී.

  හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පතනේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව, ඉකුත් වර්ෂයේදී මා විසින් සිදු කරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී නව ගොඩනැඟිල්ල සඳහා මිලදී ගත් වටිනාකම රු.4,748,609 ක් වූ යන්ත්‍ර හා උපකරණ ඉඩම් හා ගොඩනැඟිලි යටතේ ප්‍රාග්ධනිත කර තිබුණි. | | |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී වාහන හා යන්ත්‍ර උපකරණවලින් ඉවත් කරන ලද රු.458,000 ක් වටිනා ටයර්වල වටිනාකම මෝටර් රථ හා කරත්ත ගිණුමට හර කර තිබුණි. | . | |
| (ඇ) | සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු විවිධ වියදම රු.215,769 ක් වෙනුවෙන් විවිධ ණයහිමියන් යටතේ ප්‍රතිපාදන සලස්වා නොතිබුණි. | 2022 වර්ෂය සඳහා පිළියෙල කරන මූල්‍ය ප්‍රකාශනයෙන් නිවැරදි කිරීමට කටයුතු කරන බව | නිවැරදිව ගිණුම්ගත කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී සභා අරමුදලින් ගොඩනැඟිලි සංවර්ධනයට වැය කර තිබූ රු.6,983,362 ක් ඉඩම් හා ගොඩනැඟිලි යටතේ ගිණුම්ගත කර නොතිබුණි. | | |
| (ඉ) | කැකනදුර ස්වර්ණ පුර ගොඩනැඟිල්ල වායු සමීකරණය සඳහා සමාලෝචිත වර්ෂයේදී දරන ලද රු.5,256,728 ක් යන්ත්‍රසූත්‍ර උපකරණ යටතේ ප්‍රාග්ධනිත කර නොතිබුණි. | | |
| (ඊ) | ඉකුත් වර්ෂවල ණයහිමි ප්‍රතිපාදන සලස්වා තිබුණු රු.3,335,100ක ණයහිමි නිරවුල් කිරීම සමාලෝචිත වර්ෂයේ වියදමක් ලෙස ගිණුම්ගත කර තිබුණි. | | |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මූල්‍ය ප්‍රකාශන සමග ඉදිරිපත් කර තිබූ කර්මාන්ත ණයහිමි උපලේඛනයේ ඇතුලත් රු.361,330ක් වූ ණයහිමි ශේෂ 03 කට අදාල ශේෂ හා ඊට අදාල උපලේඛනයේ දැක්වෙන ශේෂ අතර එකතුව රු.626,961 ක අසමානතා පැවතුනි. | 2022 වර්ෂය සඳහා පිළියෙල කරන මූල්‍ය ප්‍රකාශනයෙන් නිවැරදි කිරීමට කටයුතු කරන බව. | අදාළ ශේෂවල වෙනස්කම් සසඳා ගිණුම් නිවැරදි කිරීමට කටයුතු කළ යුතුය. |

### 1.7 අනුකූල නොවීම්

### 1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මු.රෙ. 571 | වසර 02 ඉක්මවූ රු.1,935,910 ක් වටිනා විවිධ තැන්පතු ශේෂ 105 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදී නිරවුල් කිරීමට කටයුතු කරන බව. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ පුනරාවර්තන ආදායම රු.26,218,678 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.64,194,533 ක් විය.

### 2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

**වරිපනම්**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ වරිපනම් ඒකක සංඛ්‍යාව 5161ක් වූ අතර වර්ෂය අවසානයට වරිපනම් ඒකක 5128කින් රු.9,176,031ක හිඟ ශේෂයක් පැවතුණි. | හිඟ ශේෂය අයකර ගැනීම සඳහා ජංගම සේවා පැවැත්වීම සහ ක්ෂේත්‍රයට ගොස් හිඟ මුදල් එකතු කිරීම සිදු කරන බව. | හිඟ වරිපනම් කඩිනමින් අය කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුහසාධනය යන සභාව විසින් ඉටු කළ යුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේදී කුඹල්ගම සායනය පිහිටි ඉඩමේ පිටුපස තාප්පය ඉදිකිරීම සඳහා රු.1,658,250 ක් ගෙවා තිබුණද ඉඩමේ වැටමායිම නිරවුල් නොකර පැති බැම්ම ඉදිකිරීම සිදු කර තිබුණි. | මෙතෙක් කලක් වැට මායිම් ලෙස භාවිතා කල පැරණි වැට මායිම සැලැකිල්ලට ගෙන එම පැති බැම්ම ඉදිකිරීම් සිදු කරන ලද බව. | කඩිනමින් ක්‍රියාමාර්ග ගත යුතුය. |

### 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභා බල ප්‍රදේශයේ පිහිටි විවිධ පාර්ශවයන් වෙත ජල සැපයුම ලබා දීමේදී ජල පාරිභෝගිකයින් 196 දෙනෙකුගෙන් රු.1,482,690ක මුදලක් මාර්ග පළුදු කිරීම් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා අය කර ගෙන තිබුණද මාර්ග ප්‍රතිසංස්කරණය සඳහා වැඩ පිළිවෙලක් සකස් කර නොතිබුණි. | ක්ෂේත්‍ර පරීක්ෂණයේදී අදාළ මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම නිවැරදි නොවන අවස්ථාවලදී මුදල් නිදහස් කිරීම සිදු නොකරන බවත්, එවැනි අවස්ථාවලදී සභා කර්මාන්තයක් ලෙස අදාළ මාර්ගය ප්‍රතිසංස්කරණය කිරීමට කටයුතු කිරීම සිදු කිරීමට නියමිත බව. | විධිමත් වැඩ පිළිවෙලක් සකස් කළ යුතුය. |

### 3.3 ප්‍රසම්පාදන කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවේ නව කාර්යාල ගොඩනැගිල්ල කාපට් ඇතිරීම හා තිර රෙදි සඳහා රු.5,931,355 ක් ද පරිගණක උපාංග හා දැව භාණ්ඩ මිලදී ගැනීම සඳහා රු.1,650,900 ක්ද වැය කර තිබුණද 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය පරිපාලන) රීති අංක 178(5) ප්‍රකාරව විවෘත මිල ගණන් කැඳවා නොතිබූ අතර ලැබී තිබූ මිල ගණන් තාක්ෂණික ඇගයීම් කමිටුවකටද යොමු කර නොතිබුණි. | ඉදිරියේදී මෙවැනි අඩුපාඩු සිදු නොවීමට වගබලා ගන්නා බව. | රීති ප්‍රකාරව කටයුතු කළ යුතුය. |

### 3.4 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී සහා අරමුදල් ප්‍රතිපාදන මත ක්‍රියාත්මක කර තිබූ කොන්ක්‍රීට් කාණු හා පැතිබැම් ඉදිකිරීමේ කර්මාන්ත 18 කට අදාලව හැඩයම් සකස් කිරීමේදී පළාත් ඉංජිනේරු සේවා කාර්යාලය විසින් CT- 036 රේටය වෙනුවට ST – 057රේටය භාවිතා කිරීම නිසා 2019 පළමු භාගයේ මිල ගණන් අනුව වර්ග මීටරයකට රු.267 බැගින් හැඩයම් වර්ගමීටර් 2,105.19 ක් සඳහා රු.562,086 ක් ද 2021 පළමු භාගයේ මිල ගණන් අනුව වර්ග මීටරයකට රු.889.70 බැගින් හැඩයම් වර්ගමීටර් 898.41 ක් සඳහා රු.799,315 වශයෙන් වැඩිපුර රු.1,361,401 ක් කොන්ත්‍රාත්කරුවන්ට ගෙවා තිබුණි. | | සුදුසු හා වාසිදායක රේටයන් භාවිතා කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේ සහා අරමුදල් ප්‍රතිපාදන මත ඉදිකර තිබූ කර්මාන්ත 03 කට අදාලව මායිම් තාප්ප හා පැතිබැම්වලට සම්බන්ධ කර කාණු ඉදිකිරීමේදී හැඩයම් භාවිතා කර නොතිබියදී ඒ සඳහා හැඩයම් වර්ගමීටර් 5,956 ක් වෙනුවෙන් රු.87,095 ක් ගෙවා තිබුණි. | ඉදිරියේ දී මෙවැනි අතපසුවීම් සිදු නොකිරීමට වග බලා ගන්නා බව. | ඉටු කළ වැඩ සඳහා පමණක් ගෙවීම් කළ යුතුය. |
| (ඇ) | සමාලෝචිත වර්ෂයේදී සහා අරමුදලින් ක්‍රියාත්මක කරන ලද කොන්ක්‍රීට් කාණු සකස් කිරීමේ කර්මාන්ත දෙකකට අදාලව මීටර් 272.10 දිගට කොන්ක්‍රීට් පැති කාණු ඉදිකළ බව බිල්පත්වල ඇතුළත් කර තිබුණද ක්ෂේත්‍ර විගණන පරීක්ෂාවේදී කොන්ක්‍රීට් පැති කාණුවල දිග මීටර් 263.80 වූයෙන් මීටර් 8.3 ක් වෙනුවෙන් රු.70,893 ක් වැඩිපුර ගෙවා තිබුණි. | | |